ප්‍රසම්පාදන දැන්වීමයි

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට අයත් පහත උප ලේඛනයෙහි සඳහන් දේපළ වෙළඳ කටයුතු සඳහා 2026-01-01 දින සිට 2026-12-31 කාලයට බදු දීම පිණිස මුද්‍රා තබන ලද ලංසුපත් මා විසින් භාර ගනු ලැබේ.

1. ලංසු පත් පෝරම නිකුත් කිරීම - 2025-12-15 දින සිට 2025-12-29 දින ප:ව:3.00 දක්වා
2. ලංසුපත් භාර ගැනීම - 2025-12-30 පෙ:ව:10.00 දක්වා
3. ලංසුපත් විවෘත කිරීම - 2025-12-30 පෙ.ව. 10.30 ට

පහත උප ලේඛනයේ සඳහන් අයිතමයන් සඳහා අවම ලංසුවට වඩා වැඩි වටිනාකමකට ලංසු ඉදිරිපත් කළ යුතුය. එක් ලංසු කරුවෙකුට එක් වෙළඳ ස්ථානයක් සඳහා ඉදිරිපත් කළ හැක්කේ එක් ලංසුවක් පමණි. උපලේඛනයේ සඳහන් ලංසු කැන්පතු, ලංසු පෝරම ගාස්තු මුදලින් ගෙවීමෙන් පසු අයදුම්පතක් ලබා ගත හැකිය.

ලංසු පෝරමයේ මුල් පිටපත හා අනු පිටපත් වෙන් වෙන්ව සඳහන් කර එම කවර දෙකම එකම කවරයක බහා 2025-12-30 දින පෙ.ව.10.00 ට පෙර **"ප්‍රසම්පාදන කමිටු සභාපති, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව, ඇහැලියගොඩ"** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ප්‍රාදේශීය සභා කාර්යාලයේ තබා ඇති ලංසු පෙට්ටියේ බහාලිය හැක. ලංසු පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

වැඩි විස්තර සඳහා දිනවල රාජකාරී වේලාවන් තුළ දී ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් දැන ගත හැකිය.

උප ලේඛනය

අනු අංකය	ස්ථානය	අවම ලංසුව වාර්ෂික (රු.)	ලංසු පෝරම ගාස්තු (රු.)	ලංසු ඇප (රු.)
1	ඇහැලියගොඩ සතිපොළ හා පදික ගාස්තු අයකිරීම	1,800,000.00	5,000.00	10,000.00
2	ගැටහැත්ත සති පොළ	361,800.00	3,000.00	10,000.00
3	ඇහැලියගොඩ එළුමස් හා කුකුළු මස් වෙළඳ සැල	2,268,900.00	10,000.00	20,000.00
4	ඇහැලියගොඩ සතිපොළ භූමියේ පොදු වැසිකිළිය	135,000.00	2,000.00	3,000.00

2025-09-01 දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී.
දු.අංක. 036-2258012, 036-2258014

බන්දුලසේන දුණුවිල,
සභාපති හා ප්‍රසම්පාදන කමිටු සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.